Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# පාඨක සාමාජිකත්වය වර්ධනය කරලීමේ කාර්යයේදී මෙරට මහජන පුස්තකාලවල භූමිකාව

***ඩී.පී.ටී.පී විමලසේන*** [1]
***ඩබ්ලිව්. කේ. එම්. එම්. කේ. වීරසිංහ*** [2]

---

**සංක්ෂේපය**

මෙම පර්යේෂණය තුළින් සාකච්ඡාවට භාජනය කරන්නේ පාඨක සාමාජිකත්වය වර්ධනය කරලීමේ කාර්යයේදී මෙරට මහජන පුස්තකාලවල භූමිකාව පිළිබඳවයි. ප්‍රධාන අරමුණ ලෙස ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල පාඨක සේවා සාමාජිකත්වය වර්ධනය කිරීම උදෙසා දැනට ගෙන තිබෙන ක්‍රියාමාර්ග හඳුනා ගැනීමත් සෙසු අරමුණු ලෙස මහජන පුස්තකාලවල පාඨක සේවා සාමාජිකත්වය වර්ධනය නොවීමට බලපාන හේතු සාධක විමසීම, පාඨක සේවා සාමාජිකත්වය වර්ධනය කිරීම පිළිබඳ පාඨක අදහස් විමසා බැලීම, පාඨක සේවා සාමාජිකත්වය වර්ධනයට දැනට ගෙන ඇති ක්‍රියාමාර්ගවල සාර්ථක අසාර්ථකභාවය සොයා බැලීම පෙන්වා දිය හැකිය. මෙහිදී උපන්‍යාසය වශයෙන් මහජන පුස්තකාලවල පාඨක සේවා සාමාජිකත්වය වර්ධනයට දැනට ගෙන තිබෙන ක්‍රියාමාර්ගවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැත යන්න උපකල්පනය කෙරිණි. මෙහිදී පර්යේෂණයේදී ගවේෂණාත්මක (Exploratory) පර්යේෂණ ප්‍රවේශයන්, සසම්භාවි නියැදි ක්‍රමයත්, දත්ත එක්රැස් කිරීමට ප්‍රශ්නාවලි ක්‍රමවේදයන්, දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේශණය යනාදිය සාකච්ඡා කරයි. ඒ අනුව පුස්තකාල හතරක පුස්තකාලයාධිපතිවරු හතරක් සහ පුස්තකාල හතරක පාඨකයින් 15 බැගින් තෝරා ගන්නා ලදි. දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු, ප්‍රස්තාර හා ජාලරේඛ භාවිතා කරනු ලැබීය. එමෙන්ම සංඛ්‍යාතය, මධ්‍යන්‍යය, සම්මත අපගමනය යනාදි සංඛ්‍යාන ක්‍රමවේද යොදාගනු ලැබිණි. දත්ත විශ්ලේෂණයේදී ප්‍රධාන සාධක හඳුනා ගැනීම සඳහා ගවේෂණාත්මක සාධක විශ්ලේෂණය (Exploratory Factors Analysis) යොදා ගනු ලැබිණි. ඒ ඒ උප සාධක අතර පවතින අන්තර් සම්බන්ධය හා බලපෑමේ තරම හඳුනා ගැනිම සඳහා ක්‍රොස් tabulation යොදාගන්නා ලදි. ඒ අනුව අවසාන නිගමන වශයෙන් පාඨක සාමාජිකත්වය මධ්‍යස්ථ වශයෙන් වර්ධනය වී ඇතත් අඩුපාඩු පවතින බවත් නිගමනය කළ හැකිය. ඒ අනුව ඉදිරි පර්යේෂණ සඳහා මෙම නිගමන වැදගත් වේ.

**ප්‍රමුඛ පදඃ** පාඨක සාමාජිකත්වය, මහජන පුස්තකාලවල, පාඨක සේවා, පාඨක සේවා සාමාජිකත්වය වර්ධනය

---

1 පුස්තකාල සහ විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 මහාචාර්ය, පුස්තකාල සහ විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව